මගේ අංකය: JSC/SEC/CIR- L/2022

**අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක : 09/2022**

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,

සියලුම අධිකරණ නිලධාරීන්,

සියලුම කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් සහ

රෙජිස්ට්‍රාර් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත,

**විගණන වාර්තා ඉදිරිපත් කරන ලෙසට විගණකාධිපතිවරයාට නියෝග ලබාදීම.**

අධිකරණ සේවකයෙකු විසින් සිදු කරන ලද මුදල් අවභාවිතයක් සම්බන්ධයෙන් විගණන පරීක්ෂණයක් සිදු කර වාර්තා කරන ලෙසට මහේස්ත්‍රාත්වරයෙකු විසින් විගණකාධිපතිවරයාට නියෝග කර තිබීමත්, එවැනි අවස්ථානුගත කරුණු යටතේ අපරාධ විමර්ශන වලට අදාලව මීට පෙර ද විගණකාධිපතිවරයා වෙතින් සමහර මහේස්ත්‍රාත්වරුන් විසින් විගණන වාර්තා කැඳවා තිබීමත් පිළිබඳව අවධානයට ලක් කරමින්, එපරිද්දෙන් විගණකාධිපතිවරයාගෙන් විගණන වාර්තා කැඳවීම ඔහුගේ විෂය පථයෙන් පරිබාහිර බවත්, එමනිසා ඒ සම්බන්ධයෙන් විනිශ්චයකාරවරුන් දැනුවත් කිරීමට ක්‍රියා කරන ලෙසටත් නීතිපති දෙපාර්තමේන්තුව විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන ලද ඉල්ලීමකට අදාලව (ඇමුණුම 01), එවැනි අවස්ථාවකදී විනිශ්චයකාරවරුන්ට පවතින විකල්පය/විකල්ප කවරේද යන්න පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙතින් කරන ලද විමසීමට (ඇමුණුම 02) ප්‍රතිචාර වශයෙන් අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් *"අධිකරණ පරිපාලන කටයුතු හා සබැඳිව භාණ්ඩාගාර ප්‍රතිපාදන වලට අදාලව විනිශ්චයකාරවරයෙකුට විගණන පරීක්ෂණයක් කැඳවීමට අවශ්‍ය නම් ඒ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටිය හැකි බවත්, එසේ ඉල්ලා සිටියහොත් අමාත්‍යාංශ ලේකම්වරයාට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මඟින් විගණනයක් කර වාර්තා කැඳවීමට අධිකාරියක් පවතින බවටත්"* දැනුම් දී ඇත(ඇමුණුම 03) .

02. ඒ අනුව, ඉහත කී කරුණු අවශ්‍ය කටයුතු සඳහා ඔබගේ අවධානයට ලක් කරන ලෙසට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 ජූලි මස 27 වන දින
කොළඹ 12
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය

මගේ අංකය
எனது இல.
My No. } WP3/02/2020

ඔබේ අංකය
உமது இல.
Your No. }

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos. } 2147888
2433967
2433769
2320800
2327919

ඉලෙක්ට්‍රොනික් තැපැල
மின்-அஞ்சல்
E-mail } administration@attorneygeneral.gov.lk

ෆැක්ස්
தொலைநகல்
Fax } 2436421

නීතිපති දෙපාර්තමේන්තුව
சட்டமா அதிபர் திணைக்களம்
ATTORNEY - GENERAL'S DEPARTMENT

තැ. පෙ. අංකය
அஞ்சல் பெட்டி
P.O. Box No. } 502

කොළඹ 12.
கொழும்பு 12
Colombo 12.

2021. 11. 09

ලේකම් තුමා.
අධිකරණ සේවා කොමිෂන් සභාව.
අළුත්කඩේ.
කොළඹ 12.

<u>අපරාධ විමර්ශන වලදී විගණකාධිපතිවරයාට නියෝග ලබාදීම.</u>

අධිකරණ සේවකයෙකු විසින් සිදු කරන ලද මුදල් අවභාවිතයක් සම්බන්ධයෙන් විගණන පරීක්ෂණයක් සිදුකොට වාර්තා කරන ලෙසට මහේස්ත්‍රාත් විසින් විගණකාධිපතිවරයාට නියෝගයක් කර ඇත. එකී නියෝගයේ පිටපතක් මේ සමග අමුණා ඇත.

විගණකාධිපතිවරයාගේ කාර්භාරය සලකා බැලීමේදී වරින් වර සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව යටතේ ඔහු පාර්ලිමේන්තුවට පමණක් වාර්තා කිරීමට බැඳී සිටී. ඒ අනුව අපරාධ විමර්ශන කටයුත්තක දී එකී විමර්ශනයේ විගණකයෙකු වශයෙන් කටයුතු කිරීම ඔහුගේ කාර්යභාරය නොවේ. මීට පෙර අවස්ථාවන්හිදී ද උගත් මහේස්ත්‍රාත්වරුන් විසින් අපරාධ විමර්ශන වලදී විගණන කටයුතු සිදුකොට වාර්තා කරන ලෙසට විගණකාධිපතිවරයාට නියෝග කර තිබූ විට එය විගණකාධිපතිවරයාගේ විෂය පථයට නොවැටෙන්නක් බව අප විසින් දැනුම් දී ඇත.

නමුත්. උගත් විනිසුරුවරුන් විසින් වරින් වර මෙවැනි ඉල්ලීම් සිදු කරනු ලබන බවට අනාවරණය වන හෙයින්. ඒ කෙරෙහි අවධානය යොමු කොට. අපරාධ විමර්ශන කටයුතු වලදී විගණන කටයුතු සිදු කිරීමට විගණකාධිපතිවරයාට නියෝග නිකුත් නොකරන ලෙසට උගත් මහේස්ත්‍රාත්වරුන් ව දැනුවත් කිරීමට චක්‍ර ලේඛයක් නිකුත් කිරීම උචිත බැව් යෝජනා කරමි.

දිලීප පීරිස්.
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්.
නීතිපති වෙනුවට.

පිටපත: 1. විගණකාධිපති. ජාතික විගණන කාර්යාලය. අංක 306/1/2. පොල්දූව පාර. බත්තරමුල්ල.

ඇමුණුම 02

JSC/SEC/MOJ/2021(ii)

2021.12.17

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ මහතා,

ලේකම්,

අධිකරණ අමාත්‍යාංශය,

කොළඹ 12.

<u>අපරාධ විමර්ශන වලදී විගණකාධිපතිවරයාට නියෝග ලබාදීම.</u>

ශීර්ෂගත කරුණට අදාලව නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්, දිලිප පීරිස් මහතා විසින් මා අමතා ඇති අංක WP3/02/2020 හා 2021.11.03 දිනැති ලිපිය හා බැඳේ. (අදාල ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා ඇත)

02. ඒ පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව, අධිකරණ පරිපාලන කටයුතු හා සබැඳිව, විනිශ්චයකාරවරයෙකුට විගණන පරීක්ෂණයක් කැඳවිය හැකි, විගණකාධිපතිවරයාට පරිබාහිර ආයතනයක්, පුද්ගලයෙකු හෝ අධිකාරයක් පවතින්නේ ද යන්න පිළිබඳව ඔබෙන් විමසන ලෙසට අධිකරණ සේවා කොමිෂන් සභාව මට නියම කර ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.
o/c

ඇමුණුම 03


ලේකම් / செயலாளர் / Secretary
දුරකථනය / தொலைபேசி / Telephone 2449959
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2445447
E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය / பொது அலுவலகம் / General Office
දුරකථනය / தொலைபேசி / Telephone 2323022
ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2320785

Web Site: www.moj.gov.lk


# අධිකරණ අමාත්‍යාංශය
# நீதி அமைச்சு
# MINISTRY OF JUSTICE


තැ.පෙ. / தபால்பெட்டி / P.O. Box. 555
ඉලෙක්ට්‍රොනික තැපැල / மின்அஞ்சல் / E-mail info@moj.gov.lk
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12
மீயுயர் நீதிமன்ற கட்டிடத்தொகுதி
கொழும்பு 12
Superior Courts Complex,
Colombo 12.


මගේ අංකය / எனது இல / My No. MOJ/L13/JSC/2020

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022.04.08

එච්.එස්.සෝමරත්න මයා
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

<u>අපරාධ විමර්ශන වලදී විගණකාධිපතිවරයාට නියෝග ලබා දීම</u>.

උක්ත කරුණ සම්බන්ධයෙන් 2021.12.17 දින දරණ ලිපිය හා බැඳේ.

මේ සම්බන්ධයෙන් 125(1)(ආ) මුල්‍ය රෙගුලාසි පිළිබඳ ඔබගේ අවධානය යොමු කරමි.

"මුදල් අමාත්‍යවරයා විසින් එක් එක් අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ ඒ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වශයෙන් පත්කොට භාණ්ඩාගාරයේ විධානයන්ට යටත්ව, දෙපාර්තමේන්තු මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම (ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන්) ඔහුට පවරනු ලැබේ."

ඒ අනුව, අධිකරණ පරිපාලන කටයුතු හා සබැඳිව භාණ්ඩාගාර ප්‍රතිපාදන වලට අදාලව විනිශ්චකාරවරයෙකුට විගණන පරීක්ෂණයක් කැඳවීමට අවශ්‍ය නම් ඒ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටිය හැක. එසේ ඉල්ලා සිටියහොත් අමාත්‍යාංශ ලේකම්වරයාට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වශයෙන් අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක මගින් විගණනයක් කර වාර්තා කැඳවීමට අධිකාරියක් පවතින බවට කාරුණිකව දන්වමි.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය